# චුල්ලවග්ගපාළි වත්තක්ඛන්ධකයෙහි ආරාමික වත්පිළිවෙත් හා නූතන භික්ෂු සමාජය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ආචාර්ය, රාජකීය පණ්ඩිත, පූජ්‍ය, කොටියාගල උපරතන හිමි[1]

## හැඳින්වීම

ආත්මාර්ථ සාධනයට වඩා පරාර්ථ සාධනය උදෙසා සිය ජීවිතය කැප කොට පරාර්ථ හා ආත්මාර්ථ සාධනය ඒකාබද්ධ ඉෂ්ට වීමේ දී තෘප්තිමත් වන සමූහයකි, පරමාදර්ශී බෞද්ධ භික්ෂු සමාජය. බෞද්ධ භික්ෂු ජීවිතයේ අරමුණ වන්නේ "සියලු දුක් නැති කොට නිර්වාණාබෝධය පසක් කිරීම යි." (**සබ්බදුක්ඛනිස්සරණනිබ්බානසච්ඡිකරණත්ථාය**) සත්වග වෙසෙනා සියලු සතුන් හා තමා සංසාරදුක්ඛයෙන් එතෙර ව නිර්වාණය පසක් කරලීම භික්ෂුවගේ ඒකායන අරමුණ විය යුතු ය. එය හුදෙක් ආත්මාර්ථකාමී ක්‍රියාවලියක් නො විය යුතු ය. කෙසේ වෙතත් පළමු ව තමා ධර්මාවබෝධය ලබා ගන්නා අතර, අන්‍යයා ද ඒ තුළින් විමුක්ති සාධනය කරවීම භික්ෂුවගේ ආකල්පය යි. සම්බාධ සහිත වූ කෙලෙස් බරිත වූ ගිහි ජීවිතය හැර පියා උතුම් පැවිද්ද නිදහස් යැයි සලකා පුද්ගලයා භික්ෂුත්වයට පත් වන්නේ සංසාර දුකින් එතෙර ව නිර්වාණය පසක් කිරීමේ අරමුණ සාක්ෂාත් කරගනු පිණිස ය. භික්ෂුත්වයෙහි ඒකායන පරමාර්ථය පසෙකලා ආත්මාර්ථ සුභසිද්ධිය උදෙසා බුද්ධකාලයෙහි සිට ම ඇතැම් පුද්ගලයන් ප්‍රවිෂ්ට වූ බවක් පෙනෙයි. සිය කෙටි පරමාර්ථ සාධනය උදෙසා ඇතැම් පුද්ගලයෝ භික්ෂුත්වයට ප්‍රවිෂ්ට වී විවිධ අසාර වූ කාර්යයන් කෙරෙහි යොමු වෙති. බුද්ධකාලයෙහි මෙන් ම වර්තමානයෙහි ද මෙම සංසිද්ධිය බහුලව සිදු වෙයි. එහෙයින් ම බෞද්ධ වත්පිළිවෙත් භික්ෂු සමාජය තුළින් ගිලිහෙමින් යන බවක් පෙනෙයි. මෙම පර්යේෂණයේ දී චුල්ලවග්ගපාළි වත්තක්ඛන්ධකයෙහි ආරාමික වත්පිළිවෙත් හා නූතන භික්ෂු සමාජය පිළිබඳ තොරතුරු විමර්ශනය කෙරෙයි.

## පර්යේෂණයේ අරමුණ

බුද්ධධරමාන සමයේ සිට වර්තමානය දක්වා වූ බෞද්ධ භික්ෂුවගේ දිවි පැවැත්මෙහි හා චර්යාරටාවෙහි යම් වෙනසක් නිබඳ ව ම දැකිය හැකි වේ. බෞද්ධ භික්ෂුවගේ ජීවනරටාවෙහි යහපැවැත්ම උදෙසා යම් රීති පද්ධතියක් විනයපිටකානුගත ව බුදුන් වහන්සේ නිර්දේශ කළහ. චුල්ලවග්ගපාළි වත්තක්ඛන්ධකයෙහි නිර්දේශිත ආරාමික වත්පිළිවෙත් නූතන භික්ෂු සමාජයෙහි යහපැවැත්ම උදෙසා උපයෝගී වන ආකාරය මූලාශ්‍රයාශ්‍රයෙන් විමර්ශනය කිරීම මෙම පර්යේෂණයෙහි අරමුණ යි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයෙහි දී ප්‍රාථමික මූලාශ්‍රය, ද්විතීයික මූලාශ්‍රය හා අනෙකුත් මූලාශ්‍රය අධ්‍යයනය කිරීමත් සිදු කෙරෙයි.

---

[1]. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පාලි අධ්‍යයනාංශය. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, හෝමාගම.
*uparathanaku@gmail.com*

**පර්යේෂණ ගැටලුව**

පුරාතන භික්ෂු සමාජයෙහි යහ පැවැත්ම උදෙසා බුදුන් වහන්සේ නිර්දේශිත ආරාමික වත්පිළිවෙත්හි ප්‍රායෝගික උපයෝගීතාවක් නූතන භික්ෂු සමාජයේ යහපැවැත්මෙහි ලා යොදා ගත හැක්කේ ද? යන්න විමර්ශනය කිරීම මෙහි පර්යේෂණ ගැටලුව වේ.

**පර්යේෂණ සාකච්ඡාව/ප්‍රතිඵල**

ගිහි ජීවිතයෙහි අනේකවිධ දුක්ඛදෝමනස්සයන් වූ පළිබෝධයන් නිසාවෙන් ම සසර ගමනෙහි විනිර්මුක්තිය වූ නිර්වාණය සාක්ෂාත්කරණය උදෙසා විවිධ පුද්ගලයෝ බුදුන් වහන්සේගේ සඞ්ඝ සමාජයෙහි ප්‍රව්‍රජ්‍යාව ලැබූහ. සුවිශේෂ පරමාර්ථ හා ප්‍රතිපත්තිවලින් හෙබි බුද්ධධරමාන සමයෙහි වූ භික්ෂු සමාජය පරමාදර්ශී විය. ස්වාර්ථය පසෙකලා පරාර්ථය වෙනුවෙන් ද පෞද්ගලිකත්‍වය හැරදමා සාමූහිකත්‍වය ම අගයමින් සාමූහිකත්‍වයෙන් ක්‍රියාකරන නිසාවෙන් ම එවක භික්ෂු සමාජය 'සඞ්ඝ' යන නාමයෙන් හඳුන්වන ලදී. බුදුන් වහන්සේ සිය ශ්‍රාවකයන් හඳුන්වන ලද්දේ 'භික්ඛු' යන ව්‍යවහාරයෙනි. එහෙයින් භික්ෂු සමාජය "භික්ඛුසඞ්ඝ" නමින් හැඳින්විණි. සඞ්ඝ යන නාමයෙන් සමකාලීන ආගමික ශ්‍රමණයන් ද හඳුන්වා ඇති බව පෙනේ. තත්කාලීන ශ්‍රමණ ශ්‍රාවකයන් අතුරෙන් බෞද්ධ භික්ඛුසඞ්ඝ හෙවත් බෞද්ධ භික්ෂු සමාජය සුවිශේෂී වන්නේ සසර බිය දකිමින් පිණ්ඩපාත ආහාරයෙන් යැපෙමින් සිඳුණු බිඳුනු වස්ත්‍ර දරමින් නිර්වාණාවබෝධය ම ඒකායන අරමුණ කර ගනිමින් වෙසෙන නිසාවෙනි (**ඡින්නභින්නපටධරොතී'ති භික්ඛු**). මෙම ආර්ය ශ්‍රාවක වූ භික්ෂු සමාජය හෙවත් සඞ්ඝ සමාජය බෞද්ධ භික්ෂු සමාජය නම් වන අතර, එය පස්වග මහණුන් ප්‍රව්‍රජ්‍යාත්‍වයට පත් වීමෙන් ආරම්භ විය. බුදුන් වහන්සේගේ ප්‍රථම ධර්මදේශනාව වන ධම්මචක්කප්පවත්තන සූත්‍රදේශනාව බරණැස ඉසිපතන මිගදායෙහි දී පවත්වන අතර, එය ශ්‍රවණය කිරීමෙන් පස්වග තවුසන් අතුරෙන් කොණ්ඩඤ්ඤ තවුසා පැවිද්ද හා උපසම්පදාව ඉල්ලීය. පැවිද්ද හා උපසම්පදාව එකවර ලබා දුන් බුදුන් වහන්සේ ශ්‍රී සද්ධර්මය අවබෝධ කරගත් කොණ්ඩඤ්ඤ තවුසා 'අඤ්ඤාකොණ්ඩඤ්ඤ' නම් වූ විශේෂ නාමයෙන් හැඳින්වූහ. එහෙයින් අඤ්ඤාකොණ්ඩඤ්ඤ මහරහතන් වහන්සේ බුදුන් වහන්සේගේ ශාසනයෙහි ප්‍රථම පැවිදි භික්ෂුව, ප්‍රථම උපසම්පදා භික්ෂුව, ප්‍රථම රහතන් වහන්සේ, ප්‍රථම ශ්‍රාවකයා ආදී වූ වශයෙන් සම්බුද්ධ ශාසනයෙහි ප්‍රථම භාරකාරිත්‍වය ලැබූ රහතන් වහන්සේ වශයෙන් හැඳින්වූහ. අනතුරු ව වප්ප, භද්දිය, මහානාම හා අස්සජි යන තවුසන් සිව්දෙනා ද ධර්මාවබෝධය ලබා පිළිවෙළින් පැවිද්ද හා උපසම්පදාව ලැබූහ. බුදුන් වහන්සේ දේශිත අනත්තලක්ඛණ සූත්‍රය ශ්‍රවණය කර රහත් ඵලය ලබා ගත්හ. බෞද්ධ භික්ෂු සමාජයේ ආරම්භය සනිටුහන් වන්නේ මෙම ප්‍රථම රහත් පස්නමගෙන් ය.

බුද්ධධරමාන සමය වන විට භාරතීය සමාජය තුළ විවිධ ශ්‍රමණ සම්ප්‍රදායයන් වූ අතර, ඔවුන් විසින් ස්වීය පැවැත්ම උදෙසා විවිධ වත්පිළිවෙත් හා චර්යාරටාවන් පවත්වා ගෙන යන ලදී. බුද්ධශ්‍රාවක වූ බෞද්ධ භික්ෂු සම්ප්‍රදාය මොවුන්තුරෙන් සුවිශේෂ වූ පිරිසකි. එහෙයින් බුදුන් වහන්සේට අවශ්‍ය වූයේ පවතින ක්‍රමවේදයන්ට වඩා සුවිශේෂී වූ ක්‍රමවේදයක් හඳුන්වා දීමට ය. එහෙයින් බෞද්ධ භික්ෂු සමාජයේ යහපැවැත්ම හා චිරපැවැත්ම උදෙසා බුදුන් වහන්සේ විසින් විවිධ යහපත් වූ ක්‍රමවේදයන් හඳුන්වා දුන්හ.

"බෞද්ධ වත්පිළිවෙත්" යනු බුදුන් වහන්සේගේ දේශනා තුළ එන සුවිශේෂී ආචාරධර්මානුගත ඉගැන්වීමකි.

වෘත>ව්‍රත>වත්ත>වත>වත් යන වාග්විද්‍යාත්මක පද විකාශය තුළින් සංස්කෘත භාෂාවෙහි වෘත (ව්‍රත)යන්න පාලි භාෂාවෙන් වත/වත්ත යනුවෙන් ද සිංහල භාෂාවට 'වත්' යනුවෙන් ද පැමිණ ඇති බව පෙනේ. මේ පිළිබඳ විවිධ අර්ථකථන වියත්හු සපයා ඇති බව විවිධ භාෂානුගත ශබ්දකෝෂ විමසීමෙන් පැහැදිලි වේ. වත = ව්‍රතය, පැවැත්ම, පිළිපැදීම, වත්ත= වතාවත, කළ යුතු දෙය (හැමදීම්, පැන් ගෙන ඊම් ආදිය) යනුවෙන් පාලි සිංහල අකාරාදිය අරුත් සපයයි. මෙම අදහසට සමානව යන අරුතක් මඩිතියවෙල සුමඞ්ගල හිමියන්ගේ පාලි සිංහල ශබ්ද කෝෂයෙහි සඳහන් වේ. වත්ත = ආචාරය, පැවතීමෙහි යනුවෙන් අරුත් සපයා ඇත. මේ අනුව වත්ත යන පාලි වචනය සඳහා බොහෝ විට වත්පිළිවෙත් යන තේරුම සපයා ඇති බව පෙනේ. 'වත්' හා 'පිළිවෙත්' යන වචන දෙක එකට යෙදුන ද මෙම වචන දෙකින් ප්‍රකාශිත වන්නේ අරුත් දෙකකි. ඉංග්‍රීසියෙන් වත්පිළිවෙත් යන්නට "practices and duties" යනුවෙන් යොදා ඇති බව ඉංග්‍රීසි ශබ්දකෝෂවලින් පැහැදිලි වේ. ක්‍රියාකාරිත්වය, අභ්‍යාසය, පුහුණුව, හැකියාව ආදී අර්ථයන් වත් යන්න සඳහා භාවිත වේ. 'පිළිවෙත්' යනු වගකීම, වගවීම, හැසිරීම, ආචාරශීලිත්වය, කාර්යය ඉටුකිරීම යන අරුත් දෙන පදයකි. උදාහරණයක් ලෙස දානශාලා වත හෙවත් දානශාලා වත්පිළිවෙත් ගැන විමසීමේ දී දානශාලාවත් යනු දානශාලාව පොදුවේ භික්ෂූන් විසින් පාවිච්චි කරන ලද හෙයින් එය අලඞ්කාර ව පිරිසිදු ව පිළිවෙළකට පවත්වා ගෙන යාම හෙවත් භෞතික අලඞ්කරණය, භෞතික පැවැත්ම යහපත් ලෙස පවත්වාගෙන යාමට ක්‍රියාකාරී වීම ය.

බුදුන් වහන්සේ පන්සාළිස් වසක් දේශනා කළ ශ්‍රී සද්ධර්මය පළමු ධර්මසඞ්ගායනාවෙන් පසුව පිටකත්‍රයක් තුළ සඞ්ගෘහීත විය. එනම් විනයපිටකය, සූත්‍ර (සුත්ත) පිටකය, හා අභිධම්මපිටකය වශයෙනි. විනයපිටකය පාරාජිකපාළි, පාචිත්තියපාළි, මහාවග්ගපාළි, චුල්ලවග්ගපාළි හා පරිවාරපාළි යන ග්‍රන්ථ පහක් යටතේ සඞ්ග්‍රහ වී ඇත. මෙම ග්‍රන්ථ පහ නැවත උභතොවිභඞ්ග, ඛන්ධක, පරිවාර යනුවෙන් වර්ගීකරණය විය. මෙහි උභතොවිභඞ්ග යටතේ පාරාජිකපාළි, පාචිත්තියපාළි යන ග්‍රන්ථ දෙක අන්තර්ගත කොට ඇත. ඛන්ධක යටතේ මහාවග්ගපාළි හා චුල්ලවග්ගපාළි යන ග්‍රන්ථ දෙක එන අතර, පරිවාරපාළි ග්‍රන්ථය පරිවාර යන කොටස යටතේ සඞ්ගෘහීත ය. චුල්ලවග්ගපාළියට ඇතුළත් ඛන්ධක දොළහ (12)කි. මෙම ඛන්ධක දොළහ තුළින් වත්තක්ඛන්ධකය වැදගත් වන්නේ භික්ෂු සමාජයෙහි චර්යාපද්ධතිය හරවත් කිරීමට අවශ්‍ය හරපද්ධතිය අන්තර්ගත වන නිසාවෙනි. මේ තුළ සඞ්ගෘහීත වන වත් දාහතරකි.

**"අගාරස්මා අනගාරියං පබ්බජන්ති"** ගිහිගෙහි අනේකවිධ වූ දුක්දොම්නස් කම්කටොළු නිසාවෙන් ම අනගාරික ව පැවිදි දිවියට පිළිපන් භික්ෂුවට මුල්කාලයේ දී වාසස්ථාන, ආරාම නො වීය. කල්ගතවෙත් ම ආරාම ප්‍රතිග්‍රහණය සිදු වුවත් අනගාරික පැවිද්ද වූ නිසාවෙන් ම ආරාමයක යම් ස්ථානයක වාසස්ථානයක ගෙයක අයිතිය අනගාරික පැවිද්ද සඳහා හිමි නො වීය. කෙසේ වෙතත් බෞද්ධ භික්ෂුව වාසය කරන ස්ථානය අනෙක් විවිධ තාපස, ශ්‍රමණාදීන්ට වඩා වෙනස් ක්‍රමවේදයකට පැවතිය යුතු

නිසාවෙන් ම බුදුන් වහන්සේ ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබා දුන්හ. බෞද්ධ ආරාමයක පැවතිය යුතු ක්‍රමවේදය, පිළිවෙළ, වතාවත් හා වත්පිළිවෙත් ක්‍රමවේදය බුදුන් වහන්සේ දේශනා කළහ. චුල්ලවග්ගපාළි වත්තක්ඛන්ධකයෙහි සඳහන් වත් දාහතර බෞද්ධාරාමික ක්‍රමවේදය සනිටුහන් කරයි.

භික්ෂුව යනු භෞතික සම්පත්වලින් සපිරුණ සාරවත් ජීවිතය හැරදමා නිවන් සුව පසක් කරගැනීමේ අටියෙන් ආධ්‍යාත්මික ශාන්තියට මාර්ගය වන බ්‍රහ්මචාරී දිවියට ප්‍රවිෂ්ට වූවෙකි. පැවිද්ද සුවයක් වුව ද පැවිදි ජීවන ගමන අතිශය දුෂ්කර වූවකි. එම දුෂ්කර දිවියට ප්‍රවිෂ්ට වන පුද්ගලයා ගිහිගෙයෙහි සම්බාධ සහිත රාගාදී ක්ලේශයන්ගේ උත්පත්තියට ස්ථානයක් වන නිසාවෙන් ම හිස් අවකාශයක් වැනි වූ නිසා සසර ගමන නවතා නිවන පසක් කර ගැනීමේ අටියෙන් පැවිද්ද ලබාගනී. පැවිද්ද හෙවත් භික්ෂුත්වය යනු පුද්ගල ඒකායන පරමාර්ථය වන නිවන පසක් කර ගැනීමට ඇති හොඳ ම තෝතැන්න බව පබ්බජ්ජා සූත්‍රයෙහි සඳහන් වෙයි. විචක්ෂණශීලී වූ බුදුන් වහන්සේගේ ශ්‍රාවකයන් වූ භික්ෂූන් වහන්සේලා වත්පිළිවෙත් මැනවින් පුරන්නෝ ය. මෙය බුදුන් වහන්සේගේ අවවාදය යි. එයින් නිවන් සුව පසක් කරගන්නෝ ය. බුද්ධදේශනාව වන්නේ වත්පිළිවෙත් පිරීම තුළින් සීලය පුරා නිර්වාණය පසක් කරගත හැකි බව ය.

**පර්යේෂණ නිගමනය**

විනයෙන් තොර වූ භික්ෂු සමාජයක් නො පවතින්නා සේ ම වත්පිළිවෙතින් තොර භික්ෂු සමාජයක් ද නො පවතී. ආරාමික ජීවිතයේ සුහදත්වය, සහෝදරත්වය හා කළමනාකාරිත්වය රඳා පවතින්නේ ආරාමික වත්පිළිවෙත්හි පවතින සුභවාදී වූ නිර්දේශයන් එකිනෙකා අවබෝධ කරගැනීම තුළිනි. බුද්ධධර්මාන සමයේ සිට වර්තමානය දක්වා භික්ෂු සමාජය සමාජ ස්තරයක් ලෙසින් නො බිඳී පවතින්නට හේතු වූයේ මෙම ශික්ෂණ සමුදාය හඳුනා ගෙන ඒ තුළ නිරත වූ නිසාවෙනි. එහෙයින් නූතන භික්ෂු සමාජයේ යහපැවැත්ම උදෙසා ද චුල්ලවග්ගපාළියෙහි නිර්දේශිත ආරාමික වත්පිළිවෙත් මහෝපකාරී වේ. මෙම පර්යේෂණය සාක්ෂාත්කරණය උදෙසා මෙහි දී භික්ෂු සමාජය, බෞද්ධ වත්පිළිවෙත්, චුල්ලවග්ගපාළි වත්තක්ඛන්ධකය, බෞද්ධ භික්ෂු සමාජයේ ආරාමික වත්පිළිවෙත්, නූතන භික්ෂු සමාජය හා ආරාමික වත්පිළිවෙත් යන ප්‍රස්තුත සාකච්ඡා විය. වත්පිළිවෙතින් තොර භික්ෂු සමාජයේ යහපැවැත්මක් හා චිරපැවැත්මක් නො වනු ඇත.

**ප්‍රමුඛ පදඃ** චුල්ලවග්ගපාළි, වත්තක්ඛන්ධකය, ආරාමික වත්පිළිවෙත්, භික්ෂු සමාජය, නිර්වාණය

මූලාශ්‍රය


- **ඛුද්දකනිකාය.** (2004)(පුනර්). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **චුල්ලවග්ගපාළි.** (2004)(පුනර්). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **දීඝනිකාය.** (2004)(පුනර්). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **මහාවග්ගපාළි.** (2004)(පුනර්). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **සුත්තනිපාත.** (2004)(පුනර්). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- ජයවර්ධන, සෝමපාල (1997). **සිංහල ඉංග්‍රීසි ශබ්දකෝෂය.** මරදානඃ ගොඩගේ සහ සහෝදරයෝ.
- බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (1960). **පාලි-සිංහල අකාරාදිය.** කොළඹඃ ගුණසේන සහ සමාගම.
- සුමංගල හිමි, මඩිතියවෙල (2011). **පාළි-සිංහල ශබ්දකෝෂය.** මරදානඃ මහාබෝධි සමාගම.